## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2012 ඔක්තෝබර් මස 09 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

" රට තුළ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් රජය විවිධ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරමින් පවතී. " අපි වවමු රට නගමු ", " දිවි නැගුම " හා " පොහොර සහනාධාර ලබාදීම " වැනි ව්‍යාපෘති මඟින් ඉහළ එළවළු හා පළතුරු ඵලදාවක් ලැබෙමින් පවතී. ඵලදාව නෙලන කාලයේදී එළවළු හා පළතුරු පහසු මිලකට ලබා ගත හැකි අතර, එම කාලවලදී අතිරික්ත ඵලදාව නිෂ්ප්‍රයෝජන ලෙස විනාශ වන අවස්ථා දක්නට ඇත. එම තත්ත්වය ගොවීන්ට පාරිභෝගිකයන්ට මෙන්ම රටේ සමස්ත ආර්ථිකයට අහිතකර ලෙස බලපායි. එබැවින් ආහාර භෝග නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර ගොවීන් වෙත හඳුන්වා දීමෙන් ගොවීන්ට සිදු වන පාඩුව මඟහැර වීමටත්, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව සැලසීමටත් පියවර ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

**(යෝ/v(01)12/08)**

**02. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :**

" විදේශ විනිමය වැඩි වශයෙන් අප රටට ගලා එන්නේ විදේශ රැකියාවන්හි නියුක්තවූවන් හරහා වන අතර, එයිනුත් ගෘහ සෙවිකාවන් ලෙස සේවය කරනු ලබන කාන්තාවන්ගෙන් වඩා වැඩි දායකත්වයක් ඊට ලැබේ. ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වන කාන්තාවන් නිරන්තරයෙන් විදේශයන්හිදී ගෘහස්ථ හිංසනයන්ට ලක්වීමේ අවදානම් තත්වයට විසඳුමක් ලෙස " මහින්ද චින්තන ඉදිරි දැක්ම" ට අනුව ජාත්‍යන්තරව පිළිගත් පුහුණුවකින් පසුව රජයේ අනුමත විදේශ රැකියා සපයන ආයතන හරහා මොවුන් යොමු කිරීමට සෑම විටම කටයුතු කරන ලෙසත් එමෙන්ම එලෙස ගෘහ සේවිකාවන් හිංසනයට ලක්වීමේ ප්‍රවණතාවය වැඩි රටවල් වල රැකියා සඳහා යොමුවීම අත්හිටුවන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි . "

**(යෝ/v(01)12/**11**)**

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2012.09.26 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda - 2012.09.26docx